## ස්වාමි පුරුෂයන්ට පාසලක් - මල් හතයි බොස්

ලංකාවෙ ඉන්නකොටත් හොඳ නාට්‍ය කොහොම හරි බලන පුරුද්දක් අපේ සෙට් එකට තිබුණා. රටේ මොන තත්වයක් තිබුණත් කොහොම හරි නාට්‍යයක් හදන එක ඒ ෆීල්ඩ් එකේ හිටපු කට්ටිය



නතර කරළා තිබුණේ නැති එක වාසනාවක්. නාට්‍යයක් හදනවා කියන්නෙ මාර ගේමක් කියලා තේරුම් ගියේ සුදර්ශිය පැත්තෙ නිතරම කරක් ගහපු යාලුවෙක් මට හිටිය නිසා. වැඩේ අමාරු වුණත් ඒක දිහා බලා ඉන්න ආස හිතෙන්නේ ආරම්භයේ ඉඳල අවසානය දක්වා වැඩි ලයිව් දුවන නිසයි. ඒ ආශ්වාදේ ලංකාවෙදි හිතට වැදිල තිබුණ නිසා චූටි මල්ලි මෙහෙට එන නාට්‍ය බලන්න නොවරදවාම සෙට් වෙනවා. වැඩේ තියෙන්නෙ මෙහේ බුවාලා මෙහේට ගේන්නෙම සරළ නාට්‍ය විතරමයිනෙ. ඒව බලන එක විනෝද තමයි. ඒත් ඒවා දැනෙන්නෙ නෑ. අර නව නළු රසයද මොකක්ද කියන එක. අන්න ඒවා මෙහෙට වානා. තව පොඩ්ඩෙන් කියන්න ගිය දේ අමතක වෙනවා.

පහුගිය සතියක අපි ගියා තවත් නාට්‍යයක් බලන්න. තවත් කියලා කිව්වෙ ඒකේ නමත් ටිකක් අබ්ලික් කියලා දැනුණ නිසා. ඒත් ජය ශ්‍රීගේ වැඩක් කියල දැනගත්තම හිතුණා මේකෙ මොකක් හරි තියෙන්න ඕනෙ කියලා. සත්තයි බොස් ඒකෙ හුඟක් දේවල් තිබුණා. හුඟක්ම දේවල්. කෙටියෙන් කිව්වොත් මෙහේ නාට්‍යයක් බලපු හැමෝම හොඳයි කියන්නේ කවදද? ඒක එදා "ස්වාමි පුරුෂයන්ට පාසලක්" දවසේ උනා. ඒක මාර සතුටක්.

මට දැනුණ ඊළඟ කාරණේ තමයි දැන්වත් ලංකාවේ නාට්‍ය මත්තම නැහුණ කාලය අවසන් කළ යුතු යුගය ඇවිත් කියන එක. දැන් ඒකට නිසි මග පෙන්වීමක් තියෙනවා. නියම සම්පත් ටිකක් ජය ශ්‍රී හොයාගෙන තියෙනවා. අපේම කලාවක් ගොඩ නගන මේ කණ්ඩායමට සහයෝගය දීම මෙහි ඉන්න සියලුම දෙනාගෙ යුතු කමක් කියලයි මට හිතෙන්නෙ. එය යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන්න මම කැමතියි. ඉදිරි කටයුතු වලදි මාධ්‍ය හරහා සමාජය දැනුවත් කරන්න. අපි ඔබ සමග ඉන්නවා. චූටි මල්ලිගෙ සුබ පැතුම් බොක්කෙන්ම.

## මැයි මැයි මැයි

මැයි පළමුවෙනිදා පහුවුණා. මැයි මාසේ මැයි දිනය ගැන නොලියා ඉන්නේ කොහොමද? දවස උදා වුණේ නම් සිරි අයියගේ කෙටි කාලීන උපවාස සීන් එකෙන්. දැන් ඒක පොඩි ජෝක් එකක් වේගන යන ලක්ෂණ තිබුණත් කවුරුවත් ඔහුට දොස් කිව්වෙ නැති එක වටිනවා. මැයි රැළි 17 ක් තිබුණත් එකදු වේදිකාවකවත් ඔහුව මාතෘකාවට නොගත් එක බෙදී වෙන් වී අරගල කරන කම්කරු නායකයන් හා ඔවුන් මෙහෙයවන දේශපාලන නායකයන් තුළත් යම් දුරකට මානුෂික ගුණාංග තවමත් ඉතිරි වී ඇති බව පෙන්නුම් කෙරුණා. ඒක ධණාත්මක ලක්ෂණයක්. හොඳයි.

මැයි දිනේ ගැන සියළුම මාධ්‍ය හා ජනතාව පළ කළ අදහස් තුළ එක පොදු චෝදනාවක් තිබුණා. එනම් මැයි දිනය දේශපාලන පක්ෂ වල ග්‍රහණයට අසුවී කම්කරුවා පැත්තකට විසි වී ඇතැයි කියන කාරණය. මම නම් හිතන්නෙ ඊට වෙනස් විදිහට. මේ චෝදනාව බරපතල ලෙස ඉදිරිපත් කරන කිසිවකුට මැයි දිනය සහ එහි අරමුණ පිළිබඳව කියම වැටහීමක් තිබෙන බවක් පේන්න නැහැ. මැයි දිනය යනු සැබෑ ලෙසට අරගල කරන දිනයක් නොව කම්කරුවාගේ ශක්තිය හා එකමුතු බව පෙන්වීමටත් පොදු සටන් වලදී මිය ගිය කම්කරුවන් නායකයන් සිහිකිරීමටත් ඔවුන්ට ගෞරව කිරීමටත් අනාගතය සඳහා වැඩ සටහන් ඉදිරිපත් කිරීමට යොදා ගන්නා දිනයක් පමණයි.

ඉතින් මේ සියළු කටයුතු කම්කරුවන්ට කළ හැකි යයි යමෙක් හිතනවා නම් එය මුලාවක්. ඒ කාර්යයන් කළ යුත්තේ කම්කරුවන් නියෝජනය කරන සංවිධාන හා සමිති හරහා. ඒ සමිති හා ව්‍යාපාර රටේ පිළිගත් දේශපාලන පක්ෂ හා බද්ධ වීම අනිවාර්ය කාරණයක්. මන්ද වෘත්තීය සමිති වලට ස්වාධීනව පැවැත්මක් නොමැති බව ප්‍රායෝගිකව ඔප්පු කළ දෙයක්.

ඉතින් එහිදී වාමාංශික පක්ෂ හා නායකයන් මේ කම්කරු සංවිධාන වලට මග පෙන්වන්නන් වීම නායකත්වය ලබා දීම ඉතිහාසය පුරාම ලෝකයේම සිදුවූ දෙයක්. එයට චෝදනා කිරීම විහිලුවක්. පක්ෂ හා දේශපාලන නායකත්වයෙන් තොරව කම්කරුවන්ට කළ හැක්කේ කුමක්ද? අප තේරුම් ගත යුත්තේ එයයි.

මේ නගන චෝදනා වල යම් සාධාරණයක් තිබෙන්නේ රටේම තිබෙන කම්කරු අයිතිවාසිකම් අහිමි කෙරූ පසුත් මැයි දිනය සැමරීමය. එය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ලක්ෂණයක් වුවත්



නොවිය යුත්තකි. මගේ නම් හැඟීම කොහොම උනත් මේ තත්වයට හේතුව පක්ෂ වල වැරැද්ද නොවේ. එයට ඇති නීතිමය ප්‍රතිපාදන වල ඇති ලිහිල් ස්වභාවය. 1956 තෙක් පැවති කම්කරු සමිතියක් ගොඩ නැගීම සඳහා එම ආයතනය තුළ 40% ක සාමාජික පිරිසක් සිටිය යුතුය යන නීතිය 1956 දී සාමාජිකයන් 7 දෙනකු සිටී නම් සමිතියක් ආරම්භ කළ හැකි තත්වයට වෙනස් කිරීම නිසා වෘත්තිය සමිති ව්‍යාපාරය තුළට හැම පක්ෂයක්ම රිංගා එය කැබලි වලට වෙන්වුණා කියන කාරණය සත්‍යයක්. මේ තත්වය වෙනස් කර 1956 ට පෙර තිබූ තත්වයට යා හැකි නම් මේ බෙදී වෙන්වී යාමට ඇති ඉඩ කඩ යම් ආකාරයකින් වළක්වා ගල හැකි යයි මට හිතෙනවා.

කොහොම වුණත් දැන් ඒවා කරන්න පුලුවන් වුණත් කෙරෙන වැඩ නෙවෙයි. මැයි රැළි ටික නම් එලට තිබුණා. යූඑන්පී එකේ රැළිය සාර්ථක බව පෙනෙනවා. (80 වර්ජනයට දැන් අවුරුදු 35 ක් ගහිල්ලනෙ)

## වෙසක් ගැන

වෙසක් සහ අපි ගැන මගේ අදහස මේ වෙසගේ කියලා දැම්මොත් හොඳයි කියලා හිතුණා. අපි උපතින් බෞද්ධයෝ. ඒක අපට ලැබෙන්නෙ පියාගේ හෝ මවගේ හෝ පරම්පරාවෙන්. ඒ නිසා අපි ඒක අනුගමනය කරනවා. ඊළඟට අපි ඊට අනුකූල වුණත් නැතත් කැමති වුණත් නැතත් ඇදහුවේ නැතත් ලෝකෙ ජීවත් වෙනකකොට ආගමක් අවශ්‍ය නිසා තමන්ගෙ ආගම ලෙස බෞද්ධාගම



පිළිගන්නවා.

ඊළඟට බෞද්ධයන් වන අපට යුතුකම් තියෙනවා. පන්සල් යන්න දහම් පාසල් බෞද්ධයා නගා සිට වන්න පන්සල් නඩත්තු කරන්න. ධර්ම ප්‍රචාරණ කටයුතු වලට උර දෙන්න. දන්සල් තොරණ පෙරහැර කරන්න. මේව අපි ජීවිතේ එක් එක් කාල වලදි පුලුවන් හැටියට ඉටු කරනවා. පස් සෙන් පහු වෙනකොට ජීවිතේ විවිධ හැලහැප්පීම් එක්ක අපට ආගම ධර්මය අදහන්න ඉඩ ලැබෙන්නෙ පුරුදුදකට වාගේ. නොකර බැරි නිසා. අපෙන් පස්සෙ මේක පවත්වාගෙන යන්න අවශ්‍යමයි කියලා අපටත් අපේ දෙගුරුන් කවලා තියෙන නිසා ඒ පුරුද්ද අපි පරම්පරා වශයෙන් ඉදිරියට කරගෙන යනවා. එතකොට මේ සෙ-ˀරටම මුල් වුණ බුදුන් දෙසූ ධර්මය පිළිබඳ අපේ ඥානය හෙවත් අවබෝධය ගැන සැබෑ යථාර්ථය මොකක්ද? උත්තරය හිස් තැනක් කියලයි මට හිතෙන්නෙ. එහෙම නැත්නම් අපේ රටේ මිනිස්සු කරපු අපේ විවේචනයට ලක් වුණ දේවල් මේ රටට ඇවිල්ලත් ගෙඩි පිටින්ම පැල කරන්න උත්සාහ දරයිද? අපි මෙහෙ ඇවිල්ලත් මුල් තැන දෙන්නෙ ආමිසයට මිස ප්‍රතිපත්තියටද? කතා කරලා වැඩක් නැහැ. ඒ නිසා ලියලත් වැඩක් නැහැ.

හැබැයි මේකෙ ඉන්න අපේ කට්ටියගෙන් සීයට 99 ක් විතර බුදු බණේ එන එක කාරණාවක් නම් ඉන්තේරුවෙන්ම අවබෝධ කරගෙන ඉන්න බව නම් හොඳටම පේනවා. ඒක තමයි ආරෝග්‍යා පරමා ලාභා කියන එක. නිරෝගී බව පරම ලාභයයි. මෙහෙ ආවට පස්සෙ අපේ ජීවන රටා වෙනස් වෙලා නොයෙකුත් ලෙඩ රෝග වලට ලක්වෙලා දිනපතා බෙහෙත් ගන්න සතිපතා වෛද්‍ය පරීක්ෂා වලට යන මිනිස්සු ශබ්ර සුවතාව වෙනුවෙන් විඳින වෙහෙස මහන්සිය දැක්කාම බුදු බණ සත්‍ය බව මනාව ඔප්පු වෙනවා. ඒක බුදුන් දැක්කෙ වසර 2600 කට ඉස්සෙල්ලා.

අනික් කාරණේ තමයි අපේ මිනිස්සුන්ට බොහොම මෑතකදී අවබෝධ වෙන අනික් බුදු බණේ තමයි තන්හාය ජායතී ශෝකෝ යන්න. මේ මුදල් පස්සේ යන ඒ වෙනුවෙන් ජීවිත කාලයෙන් වැඩි කොටසක් වැය කරන අපේ මිනිස්සුන්ට ඉතා ඉක්මනට අවබෝධ වෙන්න කියවලා මේ වෙසගේ මං ප්‍රාර්ථනා කරනවා.

## අත දෙමු

නේපාලය කියන්නෙ බහතර වටෙන්ම ගොඩබිම් රාජ්‍ය වලින් වටවුණ මුහුදක් සාගරයක් නොමැති තුන්වන ලෝකයේ දුප්පත් රටක්. අපේ රටේ ඉඳලා නේපාලයේ කත්මන්ඩු වල වෛද්‍ය විද්‍යාල වල ඉගෙන ගන්න ශිෂ්‍ය ශිෂයාවන් යන නිසා සමහරු හිතන්නේ අපට වඩා දියුණුය කියලයි. එහෙම නැහැ. ඒක බොහොම දුෂ්කර ජීවන රටාවක් ඇති නොදියුණු කර රාජ්‍යයක්. නේපාලය හා ශ්‍රී ලංකාව අතර ඉතා දැඩි



සම්බන්ධතාවක් තියෙන්නෙ බුද්දාගම නිසා. බුදුන් උපන් දේශය නේපාලයයි. ලුම්බිණිය තියෙන්නෙ නේපාලයේ. (ඇත්තටම බොහෝ දෙනෙක් ලුම්බිණය තියෙන්නෙ නේපාලයේ කියල දන්නෙ නැහැ. හුඟක් අය හිතන්නෙ ඉන්දියාවෙ කියලයි)

මගේ වාසනාවකට වසර ගණනාවකට කලින් ඉන්දියන් ටුවර් එකකදි එහේ යන්න ලැබුණා. ඒ රටේ මිනිස්සුන්ගෙ දුක ගැන නම් කියලා වැඩක් නැහැ බොස්. කත්මණ්ඩු වල තත්වෙ නම් ටිකක් හොඳයි. එතනින් හැත්ක්ම කපයක් එහාට ගියාම ඕන්නෑ. වැඩේ කියන්නෙ හිඟන්නගේ පාත්තරේට හෙණහුරා කඩා වැටුණා වගේ වැඩක්නෙ මේ උනේ. පිස්සු හැදෙන ඛෙදවාචකයක්. මාධ්‍ය හරහා ඔබ සියල්ල දකින්න ඇති. මං හිතන්නෙ අපට යුතුකමක් තියෙනවා මේ වගේ ආපදාවකදි අපේ ඥාතීන් වැනි මිනිස්සු දිහා සානුකම්පිකව බලන්න. සුනාමි ව්‍යසනයේදි අතහිත දුන්නා වගේ ඔබට හැකි ආධාරයක් රෝඩි



කලෙක්ටර්ස්ලට හරි වැඩ පළේ ආයතනයේ සංවිධානය කරන ආධාර එකතුවකට හරි මොකක් හරි ආධාරයක් කරන්න. මේක මං කියන්නෙ ඒ රටේ තත්වය ඇස් දෙකෙන්ම දැක්ක නිසයි. ඒ වගේම තව දෙයක් කියන්න කැමතියි. අප ජීවත්වන ඕස්ට්‍රේලියන් රජය තමන්ගේ පුරවැසියන්ට සළකන ආකාරයත් ඔවුන් ගැන වගකියන ආකාරයත් ගැන මේ රටේ ජීවත් වන වැසියන් ලෙස අපි සතුටු විය යුතුයි. ඇත්තටම මේ වගේ රටක ජීවත්වෙන්න ලැබුණ අපි හරිම වාසනාවන්තයි. ඒක හැම විටම හිතේ තියාගන්න.

## නීතියට හිස නමමුද?

සුකුමාරන්ගෙයි චෑන්ගෙයි මරණ දෙක අරභයා තිබුණ වාදේ මාධ්‍ය හරහා ඉවර වුනාට ඒකේ දෝංකාරේ නම් තාම තියෙනවා වගේ. හැම තැනකම වගේ මේක කතා බහට මාතෘකා වෙමින් තියෙනවා. අපේ සේවා ස්ථානයෙත් මේ ගැන එක දිගට කතා බහක් ඇති වුණත් නිවැරදි කොයි පාර්ශවයද කියලා තීරණයක් නැතුව තමයි වාදේ අවසන් වෙන්නෙ. ඉන්දුනීසියාවෙන් ගෙන එන තර්ක හා ඕස්ට්‍රේලියාවෙන් නගන මානුෂික



කාරනා එක එක පැති වලින් සාධාරණයි. ඒත් නිවැරදි දෙකක් තියෙන්න බැහැ කියලයි මගේ නම් මතය. අවසන් තීරණය විය යුත්තේ ස්වාධීන රාජයයකට තමන්ගෙ රටේ පොදු ජනතාවගේ සුබ සිද්ධිය සෞඛ්‍යය ජීවිත ආරක්ෂාව පිලිබඳ තියෙන වගකීම බැහැර කරන්න බැහැ කියන එකයි. ඒ වගකීම ඉටු කරන්නට ඒ රජය ව්‍යවස්ථාවෙන්ම බැඳිලා ඉන්නවා. ඒ නිසා ස්-වාධීන රාජ්‍යයක කටයුතු වලට වෙනත් රටක් ඇඟිලි ගැසිය යුතු නැති බවයි මගේ අදහස. ඕස්ට්‍රේලියා-වටවත් ඒ සඳහා අවසරයක් නැහැ.

මගේ මතයට හුඟ දෙනෙක් විරුද්ධයි. ඒ අය තේරුම් නොගන්න දෙයක් තියෙනවා. අපි හැමදාම උත්සාහ කරන්නෙ රටක නීතිය ස්ථාපිත කරන්න නම් සැමටම එක සේ නීතිය ක්‍රියාත්මක වෙනවා නම් එයට එරෙහි වන්නේ කොහොමද? වැදගත් වන්නේ ඒ රටේ නීතියට ගරු කර ඒ රටේ නීතියට අනුව ජීවත්වීම නොවේද?

මේ තරුණයන් දෙදෙනා සිරගෙදර ගත කළ දස වසක කාලය තුළ යහපත් මිනිසුන් ලෙස පුනරුත්තාපනය වන්නට ඇති බැවින් ඔවුන්ට මරණීය දන්ඩනය ක්‍රියාකත්මක කිරීම සුදුසු නැහැ යන තර්කය සාදාරණ එකක් මිසක් නිවැරදි එකක් නෙවෙයි. අප තේරුම් ගත යුත්තේ එයයි. සාදාරණය ඉටු කරවා ගැනීමේ ක්‍රියාදාමයේදී මුලින් සාමයෙන් පසුව තගරියෙන් යන උපක්‍රමය කිවැරදි තේරීමක් නෙවෙයි. වැඩේ ඉවර වෙලා තානාපතිලා නැවත කැඳවීම වගේ දේවල් ගොං පාට් කියලයි මට හිතෙන්නෙ. නිකං ලංකාවේ කට්ටිය වලෙග් මේ දෙගොල්ලන්ට එකිනෙකා නැතිව පුලුවන්ද? ඒකනේ යථාර්ථය. ඕස්ට්‍රේලියාවේ ලොකුම ප්‍රශ්නය වෙච්ච බෝට්ටු ප්‍රශ්නය විසඳුනේ ඉන්දුනීසියාව නිසා. මෙහේ මස් වෙළඳාමේ ප්‍රධාන ගැණුම් කරුවෙක් ඉන්දුනීසියාව. මේව නැති කරගන්න ඕස්ට්‍රේලියාව කැමති වෙයිද? මේ වගේ සංදර්ශන නැතුවත් කොහොමද ඉතින් රටක් කරන්නෙ.

**පලි** - චූටි මල්ලි මරණ දණ්ඩනයට කැමති නැහැ. හැම රටක්ම මරණ දණ්ඩනය සිය නීති වලින් අයින් කරනවා නම් මාත් ඒකට අත උස්සනවා.

**චූටි මල්ලි**